ජාතික විගණන කාර්යාලය
NATIONAL AUDIT OFFICE

1.2 මතය වියාචනය සඳහා පදනම

(අ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 01 ට අනුකූල නොවීම.

ප්‍රමිතිය ප්‍රකාරව ආදායම් හා වියදම් උපචිත පදනම මත ගිණුම්ගත කළ යුතු වුවද, එයට පටහැනිව මූල්‍ය ප්‍රකාශනවල ගිණුම්කරණ ප්‍රතිපත්ති මඟින් අරමුදලට ලැබෙන මුදල්, මුදල් පදනම මත ගිණුම්ගත කරන බව හෙළිදරව්කර තිබුණි.

(ආ) ගිණුම්කරණ අඩුපාඩු

ආයෝජන වටිනාකම රු. 642,000,000 ක් සඳහා 2018 කාලපරිච්ඡේදයට අදාළව පොළී ආදායම රු.1,772,975ක් අඩුවෙන් හා රඳවා ගැනීමේ බදු රු. 2,079,025 ක් වැඩියෙන් දැක්වීම හේතුවෙන්,සමාලෝචිත වර්ෂයේ අවසාන දිනට ලැබිය යුතු ස්ථාවර තැන්පතු පොළී ආදායම රු. 3,852,000ක් අඩුවෙන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

(ඇ) විගණනය සඳහා සාක්ෂි නොවීම.

අරමුදල යටතේ දායක වී ඇති දායකයින්ගේ කේවල ගිණුම් නිසි පරිදි පවත්වා ගැනීමට කටයුතුකර නොතිබීම හේතුවෙන්, සමාලෝචිත වර්ෂය අවසාන දිනට අනිවාර්ය දායක මුදල් ගිණුමේ ශේෂය රු.24,307,762,204ක්, ස්වෙච්ඡා දායක මුදල් ගිණුමේ ශේෂය රු. 37,786,900ක් සහ රජයේ දායක මුදල් ගිණුමේ ශේෂය රු.37, 726,385,705ක් විගණනයේදී සතුටුදායක ලෙස සත්‍යාපනය කිරීමට නොහැකි විය.

(ඈ) පැහැදිලි නොකළ වෙනස්කම්

2006 වර්ෂයේ සිට 2017 වර්ෂය දක්වා මාසික ගිණුම් සාරාංශ මඟින් විවිධ රාජ්‍ය ආයතන විසින් අරමුදලට සිදුකරන ලද හර හා බැර කිරීම්වලට අදාල හඳුනා නොගත් ශේෂ නිරවුල් කරන තෙක් ගැලපුම් ගිණුමට ගලපා තිබුණි. එම ගිණුමේ 2018 දෙසැම්බර් 31 දිනට හර ශේෂය මූල්‍ය ප්‍රකාශන අනුව රු. 29,448,892ක් වුවද, ඊට අදාල උපලේඛණය අනුව ශේෂය රු. 24,158,246 ක් වූයෙන් රු. 5,290,646 ක වෙනසක් නිරීක්ෂණය විය.

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE
NAOSL

## 1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, අරමුදල අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය අරමුදල ඇවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා අරමුදලේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

අරමුදලේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව, අරමුදලේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව පවත්වනු ලබන විගණනය මත පදනම්ව අරමුදලේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ වගකීම වේ. කෙසේ වුවද, මතය වියාචනය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු හේතුවෙන් මෙම මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් විගණන මතයක් සඳහා පදනමක් සැපයීමට ප්‍රමාණවත් හා උචිත විගණන සාක්ෂි ලබා ගැනීමට මා හට නොහැකි විය.

## 2. වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ .

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE
NAOSL

- 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඇ) (III) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව අරමුදලේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.
- 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (i) (ඇ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව මෙම වාර්තාවේ 1.2 (අ),(ඇ),(ඇ) ඡේදයේ දක්වා ඇති නිරීක්ෂණ හැර ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 ලැබිය යුතු ගිණුම්

2018 දෙසැම්බර් 31 දිනට උපලේඛණය අනුව ගැලපුම් ගිණුමේ ශේෂයෙන් රු. 19,854,328 ක් වර්ෂ 1ක සිට වර්ෂ 3 ක් දක්වාත් රු. 3,187,045 ක් වර්ෂ 4ක සිට වර්ෂ 6ක් දක්වාත් රු. 874,093 ක් වර්ෂ 7ක සිට වර්ෂ 10ක් දක්වාත් සහ රු. 125,362 ක් වර්ෂ 11 ට වඩා පැරණි ශේෂයන් විය.

### 3.2 නීති රීති විධිවිධානවලට අනුකූල නොවීම

පහත සඳහන් නීති රීති විධිවිධානවලට අනුකූල නොවීම් විගණනයේදී නිරීක්ෂණය විය.

| නීති,රීති හා විධිවිධානවලට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| (අ) 1942 රාජ්‍ය සේවා අර්ථ සාධක අරමුදල් අඥා පනතේ (621 අධිකාරය) | |
| (I) 16 (1ආ) සහ 20 (ආ) වගන්ති | අකාර්යක්ෂමභාවය, විෂමාචාරය යන හේතුව මත දායකයකු සේවයෙන් පහ කරනු ලබන විට හෝ අරමුදලේ දායකයකු රාජ්‍ය සේවයෙහි විශ්‍රාම වැටුප් හිමි ධූරයකට පත්කරනු ලැබූ විට නිලධාරියා වෙනුවෙන් රජයේ දායකය හා පොලිය එකාබද්ධ අරමුදලට නැවත ගෙවිය යුතු වුවත් 2018 වර්ෂයට අදාල රු. 313,813,696 ක් නොගෙවූ |

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE
NAOSL

| | |
|---|---|
| | රජයේ දායක මුදල් හා පොලිය ආපසු ගෙවීමට කටයුතු කර නොතිබුණි. |
| (III) 25 වගන්තිය | එක් එක් මුදල් වර්ෂය අවසන් වීමෙන් පසු විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් දෙසැම්බර් 31 දිනට සාමාජික ගිණුම්වල ඇති ශේෂයන් දායකයින් වෙත දැනුම් දිය යුතු වුවත්, ඒ අනුව කටයුතු කර නොතිබුණි. |
| (ආ) 2015 ජූලි 23 දිනැති අංක 07/2015 දරන විශ්‍රාම වැටුප් චක්‍රලේඛය 08 වගන්තිය | චක්‍රලේඛ විධිවිධාන අනුව මාසික ගිණුම් සාරාංශ මගින් දායක මුදල් බැරකිරීම සිදු නොකළ යුතු වුවත් 2018 වර්ෂය තුල ආයතන 13කින් දායක මුදල් රු. 50,353,743 ක් මාසික ගිණුම් සාරාංශ මගින් බැර කර තිබුණි. |

3.3 කළමනාකරණ ක්‍රියාකාරකම්

---

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදල් දායකය ලෙස ආයතන විසින් එවන චෙක්පත් විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවේ තැපැල් අංශයෙන් රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදල් අංශය වෙත ලබා දීමට මාස 01 සිට මාස 14 දක්වා වූ කාල ප්‍රමාදයක් නිරීක්ෂණය විය.

(ii) රජයට ලැබෙන ආදායම හැකිතාක් ඉක්මනින් උපලබ්ධි කිරීමට කටයුතු කළ යුතු වුවත් රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලට ලැබෙන චෙක්පත් දින 8 සිට මාස 1 ½ ක් ප්‍රමාදයකින් බැංකු ගත කර තිබුණි.

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE
NAOSL

(iii) 2018 සැප්තැම්බර් මස කරන ලද නියැදි පරීක්ෂණයට අනුව 2018 ජනවාරි, පෙබරවාරි, මාර්තු මාසයන්හි ආපසු හරවා යවන ලද නමුත් නැවත දායක මුදල් ගෙන්වාගෙන නොතිබුණු වටිනාකම රු. 1,989,639 ක් වූ චෙක්පත් 43 ක් නිරීක්ෂණය විය.

3.4 කාර්යසාධනය

විශ්‍රාම වැටුප් නොලැබෙන රජයේ ඇතැම් සේවකයන් හට ප්‍රතිලාභ ප්‍රදානය කිරීම මූලික අරමුණුගතව රාජ්‍ය සේවා අර්ථ සාධක අරමුදල පිහිටුවා තිබුණි. 2018 ජනවාරි 01 දිනට නොගෙවූ අයදුම්පත් 954 ක් තිබූ අතර වර්ෂය තුළ අරමුදලේ සාමාජිකයින් විසින් ප්‍රතිලාභ ලබාගැනීම සඳහා ඉදිරිපත් කල අයදුම්පත්‍ර සංඛ්‍යාව 3555 ක් විය. ඒ අතුරින් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විට අයදුම්පත් 3917 ක් සඳහා රු. 354,979,757 ක් ගෙවීම් කර තිබූ අතර අයදුම්පත් 592 ක් සඳහා ගෙවීම් කර නොතිබුණි.

ඩබ්ලිව්.පී.සී. වික්‍රමරත්න
විගණකාධිපති

# ජාතික විගණන කාර්යාලය
## தேசிய கணக்காய்வு அலுவலகம்
## NATIONAL AUDIT OFFICE

මගේ අංකය / எனது இல. / My No. } එල්ඊඩබ/ඩී/ඩීඑපී//02/19/25    ඔබේ අංකය / உமது இல. / Your No. }    දිනය / திகதி / Date } 2019 ජුලි 3 දින

ගණන් දීමේ නිලධාරී

විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව

**විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවේ 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව.**

---

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1 තත්ත්වාගණනය කළ මතය**

විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවේ 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශය 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් වෙත ඉදිරිපත් කරනු ලබන මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ සඳහන් වේ. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව ගණන්දීමේ නිලධාරී වෙත වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2019 ජුනි 20 දින නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව ඉදිරිපත් කළ යුතු විගණකාධිපති වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2018 දෙසැම්බර් 31 දිනට දෙපාර්තමේන්තුවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

---

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව. இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34   +94 11 2 88 72 23   ag@auditorgeneral.gov.lk   www.auditorgeneral.gov.lk

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශය සම්බන්ධයෙන් ගණන්දීමේ නිලධාරීගේ වගකීම

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

### 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක අවප්‍රකාශයන්ගෙන් තොර බවට තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇති විය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ආර්ථික තීරණ ගැනීමේදී ඒ පිළිබඳව සැලැකිලිමත් විය යුතුය.

19-6

3

වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. මා විසින්,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාචෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කිරීමෙන් වංචා සහ වැරදි හේතුවෙන් ඇතිවන්නා වූ අවදානම් මහ හරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබා ගැනීම මාගේ මතයට පදනම් වේ. ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන අතර, දූස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම, හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.
- අවස්ථාචෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස දෙපාර්තමේන්තුවේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.
- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.
- සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීමේදී, මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව,

මාගේ විගණනයෙන් හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

**1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව**

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(ඇ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව විසින් ඉකුත් වර්ෂයට අදාලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ අවශ්‍යතාවයක් නොතිබූ බැවින් සමාලෝචිත වර්ෂය මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූපී බව ප්‍රකාශ කල නොහැකි විය.

(ආ) විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව විසින් ඉකුත් වර්ෂයට අදාළව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර නොතිබුණු බැවින් මූල්‍ය ප්‍රකාශන පිළිබඳ නිර්දේශ ඉදිරිපත් කර නොතිබුණි.

### 1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

#### 1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

- පහත සඳහන් ප්‍රමාණාත්මක ගිණුම්කරණ අඩුපාඩු අනාවරණය විය.

(අ) 2018 වර්ෂය සඳහා ආදායම් ශීර්ෂ 20.04.01.00 යටතේ දෙපාර්තමේන්තුව විසින් එකතු කරන ලද ආදායමෙහි භාණ්ඩාගාර මුද්‍රිත හා මූල්‍ය ප්‍රකාශන අනුව රු. 870,380 ක වෙනසක් නිරීක්ෂණය විය.

(ආ) **පුනරාවර්තන වියදම්**

මුදල් රෙගුලාසි 208 ප්‍රකාරව වෙනත් දෙපාර්තමේන්තු විසින් දරන ලද වියදම, මාසික ගිණුම් සාරාංශ හා භාණ්ඩාගාර පරිගණක මුද්‍රිත අතර වෙනසින් නිරූපණය වන අතර ඒ අනුව එම වෙනස රු. 34,533,914,542 ක් වූ නමුත් මූල්‍ය ප්‍රකාශනවල අක් මුදල් ගැලපුම් ගිණුමේ එම අගය රු. 33,407,328,729 ක් ලෙස දක්වා තිබීමෙන් රු. 1,126,585,813 ක් අඩුවෙන් දක්වා තිබුණි.

#### 1.6.2 දේපල පිරියත හා උපකරණ

දේපල පිරියත හා උපකරණ මූල්‍ය නොවන වත්කම් පිළිබඳ ප්‍රකාශයට අනුව ආරම්භක ශේෂය රු. 1,985,439,603 ක්ද මිලදී ගැනීම් රු. 33,762,583 ලෙසද අවසන් ශේෂය රු. 2,009,824,699 ක්ද වුවත් ස්ථාවර වත්කම් ලේඛනයට අනුව ඒවා පිළිවෙලින් රු. 1,986,066,147 ක්ද, රු. 33,630,783 ක් හා රු. 2,010,319,443 ක් වීමෙන් මූල්‍ය ප්‍රකාශනවල අවසන් ශේෂය රු. 494,744 ක් අඩුවෙන් ගිණුම්ගත කර තිබුණි.

## 2- මූල්‍ය සමාලෝචනය

### 2.1 ආදායම් කළමනාකරණය

(අ) **ආදායම් සංකේත අංකය 20:04:01:00 (මධ්‍යම රජය)**

සමාලෝචිත වර්ෂය තුළදී ආදායමෙන් ආපසු ගෙවන ලද රු. 588,412 ක් තහවුරු කර ගැනීම සඳහා 2001 ජනවාරි 15 දිනැති අංක 1/2001 දරන විශ්‍රාම වැටුප් චක්‍රලේඛය ප්‍රකාරව අදාල ආයතන වලින් භර නිවේදන ලබාගෙන නොතිබුණි.

5

(ආ) ආදායම් සංකේත අංකය 20:04:02:00 - සමාජ සංරක්ෂණ දායක මුදල් - (පළාත් සභා)

පහත නිරීක්ෂණයන් කෙරේ.

(i) ශීර්ෂ අනුව ආදායම් සංකේතයට බැර කර තිබූ දායක මුදල් හා හිඟ මුදල් දායකයන් අනුව නිශ්චිතව හඳුනාගත හැකි වන පරිදි සුදුසු දත්ත පද්ධතියක් ඇතුළු අභ්‍යන්තර පාලන ක්‍රමවේදයක් ක්‍රියාත්මක කර නොතිබුණි. ඒ අනුව සමාලෝචිත වර්ෂය තුලදී මෙම ශිර්ෂය සඳහා රැස් කරන ලද රු.මිලියන 8,683 ක් වූ ආදායම වර්ෂය සඳහා ආදායම් ලැබීම්, හිඟ ආදායම් ලැබීම් ලෙස වෙන්කර හඳුනා ගැනීමටත් දායකයා අනුව වෙන්කර ගැනීමටත් නොහැකි වී තිබුණි.

(ii) 2001 ජනවාරි 15 දිනැති අංක 1/2001 දරන විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජනරාල්ගේ චක්‍රලේඛයේ 2.1 වගන්තිය ප්‍රකාරව වැන්දඹු අනත්දරු දායක මුදල් සඳහා අයකරනු ලබන චෙක්පත් ආයතනික මට්ටමින් එවන්නේ නම් ඊලඟ මාසයේ 5 වැනි දිනට පෙර ගෙන්වා ගත යුතු වුවත් දින 70 සිට දින 184 දක්වා ප්‍රමාදයන් දක්නට ලැබුණු අතර චක්‍රලේඛයේ 2.2 වගන්තිය ප්‍රකාරව පළාත් සභා විසින් සියළුම කාර්යාලවල දායක මුදල් වෙනුවෙන් එක් චෙක්පතක් නිකුත් කරන්නේ නම් සෑම මසකම අයකිරීම් ඊළඟ මාසයේ 15 වැනි දිනට පෙර ගෙන්වා ගැනීමට කටයුතු කල යුතු වුවත් දින 10 සිට දින 54 දක්වා ප්‍රමාදයන් දක්නට ලැබුණි.

(iii) සෘජුවම චෙක්පත් මඟින් දායක මුදල් එවනු ලබන ආයතන 03 ක රු. 573,809 වටිනා චෙක්පත් 06 ක් විවිධ හේතු මත 2018 පෙබරවාරි 20 සිට 2018 අප්‍රේල් 26 දක්වා නැවත හරවා යවා තිබූ නමුත් 2019 මැයි 06 වන විට වසරකට වැඩි කාලයක් ගත වී ඇතත් එම දායක මුදල් නැවත අයකරගෙන නොතිබුණි.

2.2 වියදම් කළමණාකරණය

නිරීක්ෂණය වූ කරුණු පහත දැක්වේ.

(අ) පුනරාවර්තන වැය විෂයයන් 04 කට සහ මූලධන වැය විෂයයන් 02 කට අදාළව පිළිවෙලින් මුළු ශුද්ධ ප්‍රතිපාදනය රු. 1,202,130,000 ක් හා රු. 1,215,000 ක් වූ අතර එම වැය විෂයයන්ට අදාලව මුළු වියදම පිළිවෙලින් රු 156,994,573 ක් හා රු.885,996 ක් විය. ඒ අනුව වැය විෂයයන්ට අදාලව ඉතිරිවීම පිළිවෙලින් රු. 1,045,135,427 ක් හා රු. 329,004 ක් විය. මෙයින් වැය විෂයය එකක ඉතිරිය සියයට 100 ක් වූ අතර ඉතිරි වැය විෂයයන් 05 ක ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 17.5 සිට සියයට 28.5 දක්වා පරාසයක පැවතුණි.

6

(ආ) සමාලෝචිත වර්ෂයේ වැය විෂයයන් 06 ක් සඳහා වෙන් කර ගන්නා ලද රු. 138,117,277,300 ක ප්‍රතිපාදනයන්ට අමතරව මු.රෙ 66 හා 69 යටතේ ශුද්ධ මාරු කිරීම් රු. 374,738,000 ක් අඩුකල පසුද රු. 1,299,195,160 ක් ඉතිරිව පැවතුණි.

## 2.3 ගණන්දීමේ නිලධාරී විසින් සිදු කළ යුතු සහතිකවීම්

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වන වගන්තියේ විධිවිධාන අනුව ගණන්දීමේ නිලධාරී විසින් පහත සඳහන් කරුණු සම්බන්ධයෙන් සහතික වීම් කළ යුතුව තිබුණත්, ඒ අනුව කටයුතු කර නොතිබුණි.

(අ) දෙපාර්තමේන්තුව මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිතාවය පිළිබඳව කලින් කල සමාලෝචනය සිදු කර ඒ අනුව පද්ධති ඵලදායි ලෙස කර ගෙන යෑමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතු බවත්, එම සමාලෝචනයන් ලිඛිතව සිදු කර එහි පිටපතක් විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතුව තිබුණත්, එවැනි සමාලෝචනයන් සිදු කළ බවට ප්‍රකාශ විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

(ආ) වාර්ෂික සහ වෙනත් මූල්‍ය ප්‍රකාශ අවශ්‍ය වේලාවන් ඇතුළත පිළියෙල කිරීම සිදු වන බවට ගණන්දීමේ නිලධාරී විසින් සහතික විය යුතු අතර, ඊට අමතරව විගණනය කරනු ලබන අස්ථිත්‍යයට අදාළ වාර්ෂික වාර්තා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී වගබලාගත යුතු වුවත්, වාර්තාවේ 3.1.1 ඡේදයේ සඳහන් විගණන නිරීක්ෂණ හේතුවෙන් එම අවශ්‍යතා ඉටු කර නොතිබුණි.

(ඇ) විගණකාධිපතිවරයාට අවශ්‍ය වන පරිදි නිශ්චිත කාලසීමාවන් තුළ සියළුම විගණන විමසුම්වලට පිළිතුරු සැපයීම සිදු වන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී හා ගණන්දීමේ නිලධාරී විසින් සහතික විය යුතු වුවත්, 2018 වර්ෂය සඳහා ඉදිරිපත් කරන ලද විගණන විමසුම් 12 කට පිළිතුරු ලබා දී නොතිබුණි.

7

## 2.4 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

**නිරීක්ෂණය**

| | නීති,රීති හා රෙගුලාසි වලට යොමුව | වටිනාකම රු. | අනුකූල නොවීම |
|---|---|---|---|
| (i) | මුදල් රෙගුලාසි 170 (2) (අ) (ආ) (ඇ) (ඈ) (ඉ) | 5,991,000 | 2018 විශ්‍රාමික දිනය වෙනුවෙන් පැවැත්වෙන උත්සවය සඳහා ආයතන 15 කින් දෙපාර්තමේන්තුව වෙත ලැබී තිබූ පෞද්ගලික මුදල් රු. 5,991,000 ක 2019 ජූලි 08 වනවිටත් පොදු තැන්පත් ගිණුමේ රඳවා ගෙන තිබුණි. |
| (ii) | විශ්‍රාම වැටුප් චක්‍රලේඛ<br>2014 අප්‍රේල් මස 07 වන දිනැති සහ අංක 01/2011 (සංශෝධන) දරන විශ්‍රාම වැටුප් චක්‍රලේඛය | | සෑම ප්‍රාදේශිය ලේකම් කාර්යාලයකම මාසිකව විශ්‍රාම වැටුප් ගෙවීම් ක්‍රියාවලිය විධිමත් කිරීම සඳහා ක්‍රමවත් පාලන ගිණුමක් පවත්වාගෙන යාම අනිවාර්ය කර තිබේ. නියැදි පරීක්ෂණයකට අනුව මීගමුව,මීරිගම, ගම්පහ, වරකාපොල සහ වත්තල ප්‍රාදේශිය ලේකම් කාර්යාලය විසින් එම අවශ්‍යතාවය ඉටු කර නොතිබුණි. |
| (iii) | 2013 දෙසැම්බර් 03 දිනැති අංක 06/2013 දරන විශ්‍රාම වැටුප් චක්‍රලේඛය හා 2011 ජූනි 14 දිනැති විශ්‍රාම වැටුප් චක්‍රලේඛ ලිපි අංක 02 | | නොගෙවූ විශ්‍රාම වැටුප් නියමිත මාසයට පසු මාසයේදී විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව වෙත එවිය යුතු වුවත් එසේ නොකර අලව්ව, මීරිගම, ගම්පහ සහ වරකාපොල යන ප්‍රාදේශීය ලේකම් කාර්යයාල 04 ක එකතු වටිනාකම රු. 4,567,674 ක් පොදු තැන්පත් ගිණුමේ මාස 02 සිට මාස 12 දක්වා කාලයක් රඳවා ගෙන ආපසු එවීම සිදුකර තිබූ බව නියදි පරීක්ෂණයකදී හෙළිදරව් විය. |
| (iv) | 2009 ජූනි 08 දිනැති සහ | | වාර්ෂිකව විශ්‍රාමිකයින්ගේ ජීවිත සහතික |

| | | |
|---|---|---|
| | අංක 11/2009 දරන විශ්‍රාම වැටුප් චක්‍රලේඛය | ඉදිරිපත් කිරීමේදී ජීවන සහතිකය ග්‍රාම නිලධාරී විසින් අත්සන් කර ඉදිරිපත් කලයුතු වුවත් සමාලෝචිත වර්ෂය තුල දී වත්තල ප්‍රාදේශිය ලේකම් කාර්යාලයේ විශ්‍රාමිකයන්ගේ අත්සනින් ඉදිරිපත් කළ ජීවිත සහතික මත ගෙවීම් කළ අවස්ථා 11 ක් පැවතුණි. |
| (v) | 2009 ජනවාරි 07 දිනැති විශ්‍රාම වැටුප් 1/2009 චක්‍රලේඛයේ 08 ඡේදය | ආබාධිත දරුවන්ට විශ්‍රාම වැටුප් ගෙවීමේ කටයුතු අධීක්ෂණය පූර්ණ වශයෙන්ම ග්‍රාම නිලධාරීන්ට පැවරිය යුතුය. නිසි රැකවරණය සැලසෙන බවට ග්‍රාම නිලධාරි වගබලා ගත යුතු අතර ත්‍රෛමාසික වාර්තාවක් ගොනුවට ඇතුලත් කල යුතු වුවත් නියැදි පරීක්ෂාවේදී ගම්පහ, මීගමුව ප්‍රාදේශිය ලේකම් කාර්යාලයට අදාලව එම අවශ්‍යතාවය ඉටු කර නොතිබුණි. |
| (vi) | 2016 අප්‍රේල් 27 දිනැති විශ්‍රාම වැටුප් චක්‍රලේඛ අංක 3/2016 හා 2015 පෙබරවාරි 11 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 5/2015 | රු. 3,500 ක්වූ මාසික අන්තර් දීමනාව 2016 ජනවාරි 01 දිනෙන් පසු විශ්‍රාම ගන්නා ලද විශ්‍රාමිකයන්ට හිමිනොවන නමුත් ඊට පටහැනිව වරකාපොල ප්‍රාදේශිය ලේකම් කාර්යාලයේ විශ්‍රාමික නිලධාරීන්ට 3 දෙනෙකුට උක්ත අන්තර් දීමනාව ලෙස රු. 261,991 ක් ගෙවා තිබුණි |

**2.5 අත්තිකාරම් නිකුත් කිරීම හා පියවීම**

පහත නිරීක්ෂණයන් කෙරේ.

(අ) මුදල් රෙගුලාසි 371(2)(ඇ) ප්‍රකාරව අත්තිකාරම අදාල කාර්යය අවසන් කල වහාම පිය විය යුතු වුවද, රු. 50,000 ක්වූ අත්තිකාරම් 4 ක් පියවීමට අත්තිකාරම් ලබාගත් දින සිට දින 42 සිට 114 දක්වා කාල පරාසයක් ගෙන තිබුණි.

(ආ) විගණනයට ඉදිරිපත් කල රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුමේ සැසඳුම් ප්‍රකාශය අනුව 2018 දෙසැම්බර් 31 දිනට වැඩ තහනම් කර ඇති සේවය අතහැර ගොස් ඇති හා මාරු වී ගිය නිලධාරීන්ගෙන් අයවිය යුතුව තිබුණු ශේෂ වල එකතුව රු. 3,290,000 ක් විය. එම හිඟ හිටි ශේෂ අතරින් වර්ෂ 1 ක සිට 5 දක්වා කාලයක සිට නිලධාරීන් 04 දෙනෙකුගෙන් අයවිය යුතු ශේෂය රු. 744,602 ක් විය. තවද, වර්ෂ 5ට වැඩි කාලයක සිට නිලධාරීන් 14

19-ශු

9

දෙදෙනකුගෙන් අයකර ගත යුතු හිඟ හිටි ශේෂය රු. 572,236 ක් වූ නමුත් එම හිඟ හිටි ශේෂ 2018 දෙසැම්බර් 31 දක්වා නිරවුල් කරගෙන නොතිබුණි.

**2.6 තැන්පතු**

දෙපාර්තමේන්තුවේ සේවයේ නියුතු ක්ෂේත්‍රගත නිලධාරීන් 05 දෙනෙකු වෙනත් සේවයකට යාම නිසා එම නිලධාරීන්ට ලබාදුන් යතුරු පැදි සඳහා අයකර ගන්නා ලද රු. 696,500 ක මුදල් ජාතික අයවැය දෙපාර්තමේන්තුවට යැවීමකින් තොරව 2018 ඔක්තෝබර් සිට පොදු තැන්පත් ගිණුමේ රඳවාගෙන තිබුණි.

**3 -මෙහෙයුම් සමාලෝචනය**

**3.1 කාර්යසාධනය**

**3.1.1 වාර්ෂික කාර්යසාධන වාර්තාව**

2002 සැප්තැම්බර් 12 දිනැති අංක 402 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් මුදල් වර්ෂය අවසාන වී දින 150 ක් ඇතුළත සමාලෝචිත වර්ෂයට අදාළ කාර්යසාධන වාර්තාව පාර්ලිමේන්තුවේ සභාගත කළ යුතු වුවත් 2018 වර්ෂයට අදාල වාර්තාව 2019 ජූලි 08 වන විටත් සභාගත කර නොතිබුණි.

**3.2 ප්‍රසම්පාදනයන්**

පහත නිරීක්ෂණයන් කෙරේ.

(අ) දෙපාර්තමේන්තුවේ අංශ 6 ක නවීකරණ කිරීම සඳහා පෞද්ගලික කොන්ත්‍රාත්කරුවකුට භාර දී තිබූ අතර ඔහු විසින් ඉදිරිපත් කරන ලද බිල්පත්‍රයේ සඳහන් කාර්යයන් හා විගණනය මඟින් භෞතික පරීක්ෂාවේදී නිරීක්ෂණය කල පරිදි ඇස්තමේන්තුවට අනුව කාර්යයන් සිදුකර නොතිබියදී රු. 332,151 ක්ද ඉටු නොකල කාර්යයන් සඳහා රු. 1,132,748 ක් ද වැඩිපුර ගෙවා තිබුණි.

(ආ) දෙපාර්තමේන්තුවේ තොරතුරු තාක්ෂණ අංශය නවීකරණය කිරීම සඳහා බිල්පත් පියවීමේදී ගණනය කිරීමේ දෝෂයක් හේතුවෙන් රු රු. 122,939 ක් වැඩිපුර ගෙවා තිබුණි.

(ඇ) රජයේ විගණන අංශය, අභ්‍යන්තර විගණන අංශය සහ විෂමතා හා දායක මුදල් අංශ සඳහා වායුසමීකරණ යන්ත්‍ර මිලදී ගැනීම සහ සවි කිරීමේදී ඉටු නොකළ කාර්යයන් සඳහා රු. 114,954 ක් වැඩිපුර ගෙවා තිබුණි.

10

### 3.3 මූල්‍ය අක්‍රමිකතා ස්වරූපයේ ගනුදෙනු

(අ) ගම්පහ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය මගින් සිවිල් හා වැන්දඹු ලෙස විශ්‍රාම වැටුප් 02 ක් ලබමින් සිට 2012 මැයි 30 දින මිය ගිය විශ්‍රාමික නිලධාරිනියකගේ විශ්‍රාම වැටුප 2012 ජූනි සිට 2016 දෙසැම්බර් දක්වා මාස 55 ක් විශ්‍රාමිකයාගේ බැංකු ගිණුමට බැර කර තිබුණි. එසේ බැර කරන ලද රු. 2,696,303 ක් ATM කාඩ්පත භාවිතා කර විශ්‍රාමිකයාගේ පුතා විසින් ඉවත් කරගෙන තිබුණි. මෙයින් රු. 308,052 ක මුදලක් ඔහු විසින් දෙපාර්තමේන්තුවට ගෙවා ඇතත් ඉතිරි රු. 2,388,251 ක මුදල 2019 ජූනි 30 වන විටත් අයකර ගැනීමට දෙපාර්තමේන්තුව අවශ්‍ය පියවර ගෙන නොතිබුණි.

(ආ) විශ්‍රාමික අංක 01- 600772 යටතේ විශ්‍රාම වැටුප් ලබමින් සිට 2013 නොවැම්බර් 07 දින මියගිය නිලධාරිණියකගේ 2013 දෙසැම්බර් සිට 2016 අප්‍රේල් මස දක්වා මාස 29 ක විශ්‍රාම වැටුප වූ රු. 582,423 ක් විශ්‍රාමිකයාගේ බැංකු ගිණුමට බැර කර තිබුණි. වරින් වර ATM කාඩ්පතක් භාවිතා කරමින් මෙම ගිණුමේ මුදල් ලබා ගෙන තිබූ අතර 2019 ජූනි 30 වන විටත් ඉවත් කරගෙන තිබූ රු. 581,916 ක් අයකර ගැනීම සඳහා දෙපාර්තමේන්තුව පියවර ගෙන නොතිබුණි.

(ඇ) විශ්‍රාමික අංක 01-600575 යටතේ ගම්පහ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් තාවකාලික විශ්‍රාම වැටුපක්ද, විශ්‍රාමික අංක 01 – 620195 යටතේ මහර ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් ස්ථිර විශ්‍රාම වැටුපක්ද වශයෙන් 1991 ජනවාරි සිට 2016 පෙබරවාරි 29 දක්වා වසර 20 ක කාලයක් විශ්‍රාම වැටුප් 02 ක් නිලධාරියෙකු විසින් ලබාගෙන තිබුණි. මෙලෙස ගම්පහ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් වැඩිපුර ලබාගත් මුදල රු. 1,872,387 ක් වී තිබුණු අතර 2016 පෙබරවාරි 10 සිට විශ්‍රාම වැටුප් ගෙවීම නවතා තිබූ නමුත් වැඩිපුර ගෙවා තිබූ මුදල් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඈ) විශ්‍රාම වැටුප් අංක 21-0-105353 දරණ විශ්‍රාමික නිලධාරිනිය 2011 මාර්තු 11 වන දින මියගොස් තිබුණු අතර විශ්‍රාම වැටුප් දත්ත පද්ධතියෙහි විශ්‍රාමිකයාගේ උපන් වර්ෂය 1930 ලෙසත් ජාතික හැඳුනුම්පත් අංකය 608212523V ලෙසත් සඳහන්ව තිබුණි. ජාතික හැඳුනුම්පත් අංකය ඇයගේ දියණියගේ වූ අතර මිය ගිය දින සිට 2018 ජූලි මස විශ්‍රාම වැටුප් ගෙවීම නවතා දමන තෙක් මවගේ විශ්‍රාම වැටුප ලෙස රු. 1,562,470 ක් දියණිය විසින් සාවද්‍ය ලෙස ලබාගෙන තිබුණි.
2011 වර්ෂයෙන් පසු ජීවත් වීමේ සහතිකයක් නොමැති වීම මත විශ්‍රාම වැටුප් ගෙවීම තවකාලිකව නතර කිරීමට ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ විශ්‍රාම වැටුප් නිලධාරින් විසින් කටයුතු කර නොතිබුණු අතර විශ්‍රාම වැටුප් බද්ධ බැංකු ගිණුමට බැර කර තිබුණි.

### 3.4 පාඩු හා හානි

මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) මූල්‍ය ප්‍රකාශනවල සටහන 1 හි සමාලෝචිත වර්ෂයේදී තවදුරටත් අයකර ගත යුතු විශ්‍රාම වැටුප් වැඩිපුර ගෙවීම් වටිනාකම රු.මිලියන 591 ක් වී තිබුණි. මෙම මුදල් වර්ෂ 10 කට වඩා වැඩි කාලයක සිට පැවත එන රු. මි. 8 කින්ද වර්ෂ 5 සිට වර්ෂ 10 ක් දක්වා කාල පරාසයක සිට පැවත එන රු. මි. 37 කින් හා වර්ෂ 5 ක අඩු කාලයකට අයත් රු. මි. 546 කින් ද සමන්විත වූ නමුත් මෙම වැඩිපුර ගෙවීම් අයකර ගැනිම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

(ආ) හානි හා පාඩු ලේඛනයේ සඳහන් 2017 දෙසැම්බර් 31 හා 2018 ජනවාරි 01 අවසන් හා ආරම්භක ශේෂ සැසඳීමේදී ප්‍රාදේශීය ලේකම් කාර්යාල වලින් කරනු ලබන අය කිරීම්වලට අනුව ප්‍රාදේශීය ලේකම් කාර්යාල 213 ක සහ දෙපාර්තමේන්තුව විසින් කරනු ලබන අය කිරීම්වලට අනුව ප්‍රාදේශීය ලේකම් කාර්යාල 231 ක නොසැසඳිම නිරීක්ෂණය විය.

(ඇ) 2015 ජූලි 05 දිනැති සහ අංක 5/2015 දරන විශ්‍රාම වැටුප් චක්‍රලේඛය ප්‍රකාරව විශ්‍රාමිකයාට/දායකයාට වයස අවුරුදු 55 තෙක් අවසන් වරට සේවය කල ආයතනය විසින් වැටුප් ගෙවන්නේ නම් රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 6/2006 ට අනුව විශ්‍රාම වැටුප් සංශෝධනය නොකළ යුතු වුවත් ඊට පටහැනිව වරකාපොළ ප්‍රාදේශිය ලේකම් කාර්යාලයේ එක් වැන්දඹු විශ්‍රාම වැටුපක් සංශෝධනය කර 2018 ඔක්තෝබර් දක්වා රු. 156,081 ක් වැඩිපුර ගෙවා තිබුණි.

(ඇ) විශ්‍රාම වැටුප් දත්ත පද්ධතිය පරීක්ෂා කිරීමේදී විශ්‍රාමිකයකු විශ්‍රාම වැටුප් අංක 521426 යටතේ සිවිල් විශ්‍රාම වැටුපක් සහ විශ්‍රාම වැටුප් අංක 02-1101946 යටතේ ගුරු විශ්‍රාම වැටුපක් ලෙස විශ්‍රාම වැටුප් 2ක් වර්යාා සටහන් 2 ක් ඉදිරිපත් කර ලබාගෙන තිබුණි. මෙම පුද්ගලයාට විශ්‍රාම වැටුප් අංක 01-521426 යටතේ 2010 වර්ෂයේ සිට 2019 ජනවාරි දක්වා රු. 1,535,224 ක් හා විශ්‍රාම වැටුප් අංක 02-1101946 යටතේ 2011 වර්ෂයේ සිට 2019 ජනවාරි දක්වා රු. 3,562,555 ක් ගෙවා තිබුණි. මේ පිළිබඳ පරීක්ෂා කර වැඩිපුර ගෙවන ලද මුදල් ආපසු අයකර ගැනීම සඳහා දෙපාර්තමේන්තුව කටයුතු කර නොතිබුණි.

### 3.5 අනාර්ථික ගනුදෙනු

සහායක සේවා කවුළු ක්‍රියාකරුවන් තනතුර 02 ක් කොන්ත්‍රාත් පදනමට බඳවා ගැනිම සඳහා 2018 ඔක්තෝබර් 05 දින පළ කරන ලද පුවත්පත් දැන්වීම සඳහා රු. 156,984 ක් වැයකර තිබුණත් 2019 මැයි 29 දින වන විටත් බඳවා ගැනීම සිදු කර නොතිබුණි.

12

### 3.6 කළමනාකරණ දුර්වලතා

(අ) රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 6/2006 ට අනුව විශ්‍රාම වැටුප් සංශෝධනය නොකල මීගමුව, මීරිගම, ගම්පහ, අලව්ව, වරකාපොල, වත්තල යන ප්‍රාදේශිය ලේකම් කාර්යාල 06 ක ලිපිගොනු සංඛ්‍යාව 669 ක් වී තිබුණි.

(ආ) අංක 1719/3 හා 2011 අගෝස්තු 15 දිනැති අති විශේෂ ගැසට් නිවේදනයේ සඳහන් පරිදි උපතින් පූර්ණ ආබාධිත නොවන තැනැත්තන් වසර 05 කට වරක් වෛද්‍ය මණ්ඩලයට යොමු කල යුතු වුවත් මීගමුව, මීරිගම, ගම්පහ, අලව්ව, රඹුක්කන ප්‍රාදේශිය ලේකම් කාර්යාලවල උපතින් පූර්ණ ආබාධිත නොවන තැනැත්තන් කිසිවෙකුත් කිසිම දිනක වෛද්‍ය මණ්ඩලයකට යොමුකර නොතිබුණි.

(ඇ) විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ 2014 ඔක්තොබර් 16 දිනැති චක්‍රලේඛ ලිපි අංක 04 පරිදි ප්‍රථම මාසික විශ්‍රාම වැටුප ගෙවීම ආරම්භ කර උපරිම වශයෙන් මාස 03 ක් ගෙවෙන විටදී විශ්‍රාම වැටුප් ලිපිගොනුව අදාල ප්‍රාදේශිය ලේකම් කාර්යාලය වෙත ලැබිය යුතු වුවත් මීගමුව, ගම්පහ සහ වරකාපොළ ප්‍රාදේශිය ලේකම් කාර්යාල 03 හි මාස 3 ක් ගත වූ පසුත් විශ්‍රාම වැටුප් ලිපිගොනු 65 ක් ලැබී නොතිබුණි. ගොණුව ලැබිය යුතු දින සිට ප්‍රමාද කාලය මාස 01 සිට මාස 16 දක්වා වී තිබුණි.

(ඈ) විශ්‍රාමිකයින් මියයාම කාලීනව දැනුම්නොදීම.

i. ග්‍රාම නිලධාරි විසින් විශ්‍රාමිකයන්ගේ මියයාම් නියමිත දිනට දැනුම් නොදිම හේතුවෙන් ගම්පහ ප්‍රාදේශිය ලේකම් කාර්යාල හරහා විශ්‍රාම වැටුප් ලබා මියගිය විශ්‍රාමිකයින්ගේ බැංකු ගිණුම්වලින් විශ්‍රාම වැටුප් ලෙස ගෙවූ රු. 2,518,420 ක් ආපසු ගෙන්වා ගැනිමට විශ්‍රාමිකයා මියගිය දින සිට වසර එකකට වඩා වැඩි කාලයක් ගත වී තිබුණි. මේ අන්දමට නොගෙවූ විශ්‍රාම වැටුප් වෙනත් බැංකු ගිණුම්වල අකර්මන්‍යව පවත්නා අවස්ථා නිරික්ෂණය විය.

ii. විශ්‍රාමිකයා මියගිය බව ප්‍රාදේශිය ලේකම් කාර්යාලය දැනුවත් නොවිම හේතුවෙන් මියගිය විශ්‍රාමිකයින් වෙත විශ්‍රාම වැටුප් ගෙවා තිබූ අතර ගම්පහ ප්‍රාදේශිය ලේකම් කාර්යාලයේ 2016 වර්ෂයේ මියගිය විශ්‍රාමිකයන් 10 කට වැඩිපුර ගෙවූ රු. 336,378 ක් හා 2017 වර්ෂයේ මියගිය විශ්‍රාමිකයින් 7 දෙනෙකුට වැඩිපුර ගෙවූ රු. 750,390 ක් වූ සම්පූර්ණ මුදලම 2018 දෙසැම්බර් මාසය වන විටත් අයකර ගෙන නොතිබුණි.

19 (ය)



(ඉ) <u>ලේඛනාගාරය නිසි ලෙස නඩත්තු නොකිරීම.</u>

ගම්පහ ප්‍රාදේශිය ලේකම් කාර්යාලයේ 2018 අප්‍රේල් 30 දිනට දත්ත පද්ධතිය අනුව විශ්‍රාමිකයින් 11,274 ක් සිටින අතර එයින් විශ්‍රාමිකයින් 10,963 කගේ ලිපිගොනු ලේඛනාගාරයේ තබා තිබුණි. ලේඛනාගාරයේ ලිපිගොනු ඉක්මනින් සොයාගත හැකි ආකාරයට වර්ගීකරණය කර අසුරා නොතිබුණි. ලිපිගොනු අපිළිවෙලට අසුරා තිබූ අතර ලිපිගොනු දූවිලි හා මකුළුදැල් බැදී විනාශ වී යන තත්ත්වයට පත්ව තිබූ අතරම පවත්නා ස්ථානය අනුව ලිපිගොනුවලට ප්‍රමාණවත් ආරක්ෂාවක් නොමැති බවද නිරීක්ෂණය විය. තවද අළුතින් සකස් කර තිබූ ලේඛනාගාරය විගණිත දින වන විටත් නිෂ්කාර්යව පැවතුණි.

(ඊ) අංක 9/2008 (සංශෝධන II) දරන 2018 ජූලි 17 දිනැති විශ්‍රාම වැටුප් චක්‍රලේඛය ප්‍රකාරව සේවා කාලය සම්පූර්ණ නොවූ විශ්‍රාමිකයින් සඳහා ගෙවනු ලබන දුබලතා විශ්‍රාම වැටුප ගෙවීම නතර කර 59 කාණ්ඩය යටතේ ගෙවනු ලබන මූලික වැටුප සමඟ දුබලතා විශ්‍රාම වැටුප දත්ත පද්ධතිය තුල DSA වෙන්කර දැක්විය යුතු වුවත් වරකාපොළ සහ අලව්ව ප්‍රාදේශිය ලේකම් කාර්යාල විශ්‍රාම වැටුප් ඒකාබද්ධ කර නොතිබූ බව නිරීක්ෂණය විය.

(උ) ගම්පහ ප්‍රාදේශිය ලේකම් කාර්යාලයේ අවකරණ වාර්ථා අනුව විශ්‍රාමිකයින් 3 දෙනෙකුගේ 2018 ජනවාරි 01 දිනට අයවීමට තිබූ රු. 695,631 ක වැඩිපුර ගෙවීම 2018 ජූලි 07 දින වන විටත් එසේම පැවතුණු අතර මෙයින් රු. 582,423 ක් වූ වැඩිපුර ගෙවීමක් අයකර ගැනීම සඳහා නඩු පවරා තිබුණි.

(ඌ) ප්‍රාදේශිය ලේකම් කාර්යාල 2 ක වැඩිපුර ගෙවූ විශ්‍රාම වැටුප් නැවත අයකිරීම පිළිබඳ කාර්තු වාර්තා අනුව අවස්ථා 09 කදී රු. 745,299 ක් වූ වැඩිපුර ගෙවීම, වාර්තා වූ දිනයේ සිට නැවත අයකර ගැනිම ආරම්භ කිරීමට මාස 08 සිට මාස 16 ක් දක්වා කාල පරාසයක් ගත වී තිබුණි.

(එ) විශ්‍රාම වැටුප් ගෙවනු ලබන සෑම විශ්‍රාමිකයකු සඳහාම විශ්‍රාම වැටුප් ගොනුවක් පවත්වාගෙන යායුතු වුවද මීගමුව, මීරිගම , ගම්පහ, අලව්ව, වරකාපොල, වත්තල ප්‍රාදේශිය ලේකම් කාර්යාලය 6 ක ලිපිගොනු නොමැතිව විශ්‍රාමිකයින් 512 කට විශ්‍රාම වැටුප් ගෙවමින් පැවතුණි.

(ඒ) මීගමුව ප්‍රාදේශිය ලේකම් කාර්යාලය විශ්‍රාමිකයින් 54 දෙනෙකු සඳහා සකස් කර තිබූ තාවකාලික ගොනුවල ලියවිලි දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර අනුමත කරවා ගැනිමට කටයුතු කර නොතිබුණු අතර විශ්‍රාම වැටුප් දත්ත පද්ධතිය අනුව ප්‍රාදේශිය ලේකම් කාර්යාල සීමාවෙන් පිටත පදිංචි විශ්‍රාමිකයින් 23 දෙනෙකු මීගමුව ප්‍රාදේශිය ලේකම් කාර්යාලයෙන් විශ්‍රාම වැටුප් ලබා ගනිමින් තිබුණි.

14

(ඔ) විශ්‍රාම වැටුප් ගෙවීම් දත්ත පද්ධතියේ ජාතික හැඳුනුම්පත් අංක නොමැතිව මීගමුව, මීරිගම , ගම්පහ, අලව්ව, වරකාපොල, වත්තල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය 06 ක විශ්‍රාම වැටුප් ගෙවීම් සිදුකරන අවස්ථාවන් 99 ක් පවතින බව නිරීක්ෂණය විය.

## 4- මානව සම්පත් කළමනාකරණය

### අනුයුක්ත කාර්ය මණ්ඩලය තථ්‍ය කාර්ය මණ්ඩලය හා පුද්ගල පඩිනාඩි සඳහා වියදම

2018 දෙසැම්බර් 31 දිනට වූ අනුමත, තථ්‍ය, පුරප්පාඩු හා අතිරික්ත සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| | සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව | අතිරික්ත සංඛ්‍යාව |
|---|---|---|---|---|---|
| (i) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 34 | 24 | 10 | - |
| (ii) | තෘතීයික මට්ටම | 11 | 06 | 05 | - |
| (iii) | ද්විතීයික මට්ටම | 1078 | 942 | 136 | - |
| (iv) | ප්‍රාථමික මට්ටම | 75 | 57 | 18 | - |
| (v) | වෙනත් (අනියම්) | 06 | 08 | - | 02 |
| | එකතුව | 1204 | 1037 | 169 | 02 |

රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් 2009 පෙබරවාරි 20 දිනැති අංක 1589/30 දරණ අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද කර්ය පටිපාටි රීති I වැනි කාණ්ඩයේ 18 වැනි පරිච්ඡේදයේ විධි විධාන අනුව විශ්‍රාම වැටුප් නිලධාරීන් සහ ලේඛණ සහකාර නිලධාරීන් සඳහා වන වාර්ෂික ස්ථාන මාරුවීම් ප්‍රතිපත්තිය ප්‍රකාරව එකම සේවා ස්ථානයක වසර 05 කට වඩා වැඩි කාලයක් සම්පූර්ණ කර ඇති නිලධාරීන් අනිවාර්යයෙන් ස්ථාන මාරු කෙරෙන බව දක්වා තිබුනද නිලධාරීන් 8 දෙනෙකු වසර 10 කට වඩා වැඩි කාලයක්ද, නිලධාරීන් 11 දෙනෙකු වසර 6 ත් 10 ත් අතර කාලයක්ද විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තු ප්‍රධාන කාර්යාලයේ සේවයේ යෙදී තිබුණි.

Athenagama

ඩී.ජී.අයි. පද්මිණි
සහකාර විගණකාධිපති
විගණකාධිපති වෙනුවට